**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) - III අදියර - 2019**

--------------------------------------------------------------------------------

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ III අදියරේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන ආනයන හා අපනයන බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 16 දින ඇතුලත් වූ අංක පීබීසී (2014) 15 එකතු අංක (309) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අඩු කිරීමට හා රටේ අනිකුත් ප්‍රදේශවලට සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොළඹ නගරයෙන් පිටතට යන අනෙකුත් ජාතික මාර්ගවලට සම්බන්ධ කෙරෙන කොළඹ නගරයෙන් බැහැර අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුලින් ශ්‍රී ලංකාවේ පලාත් අතර ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීමට දායක වීමය. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 76,200 කට සමාන එ.ජ.ඩො මිලියන 590 ක් වූ අතර ඉන් රු.මිලියන 63,356 කට සමාන එ.ජ.ඩො. මිලියන 494 ක් මූල්‍යායනය කිරීමට චීන ආනයන හා අපනයන බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු ආරම්භ කර තිබුණු අතර 2019 ජුනි වන විට අවසන් කිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2019 දෙසැම්බර් 03 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණන කල මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කරන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම්

හැර අඛණ්ඩ පැවැත්මේ  පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර,  ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | -------------- | -------------- | ------------------- | ------------------ |
| (අ) | මාර්ගයේ දිගේ අධිබලැති විදුලි රැහැන් විතැන් කිරීමට සහ ජයසුමනවත්ත හා මිල්ලගහවත්ත ඉඩම් නැවත පදිංචිකිරීමේ ස්ථාන සංවර්ධන පිරිවැය එකතුව රු.මිලියන 8.13 ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ යටතේ වාර්තා කිරීම වෙනුවට මාබෝල සහ ඇලකන්ද ඉඩම්වලට ප්‍රාග්ධනික කර ඇත. | අදාල නොවන පිරිවැයකින් මාබෝල සහ ඇලකන්ද ඉඩම්වල පිරිවැය ඉහල ගොස් තිබුණි. | ජයසුමනවත්ත හා මිල්ලගහවත්ත නැවත පදිංචිකිරීමේ ස්ථාන සංවර්ධන පිරිවැය සහ මාබෝල සහ ඇලකන්ද ඉඩම් පිරිවැය(උස්වැටකෙයියාව) ඉඩම් සහ ඉඩම් සංවර්ධන වැය විෂය මගින් සිදුකර තිබේ. | වත්කම්වලට වටිනාකම නිවැරදිව දැක්වීමට ගිණුම්කරන ප්‍රමිති සමග අනුකූල වීමට පියවර ගත යුතුය. |
| (ආ) | පිටත වටරවුම මහා මාර්ගයේ (අදියර I) ව්‍යාපෘතියට ගෙවිය යුතු රු.මිලියන 1,984ක් 2015 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. කෙසේවෙතත්, මාර්ග සංවර්ධන අධිකාරියට වත්කම් භාරදීමෙන් පසු 2015 වර්ෂයේදී පිටත වටරවුම මහා මාර්ගයේ මෙහෙයුම් කටයුතු අවසන් කර තිබුණි. | ජංගම වගකීම් වැඩියෙන් දැක්වේ. | 2013.07.31 දක්වා OCHP ව්‍යාපෘතියේ අදියර I සහ අදියර II එකම ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක විය. ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු යටතේ 2013.08.01 දින ව්‍යාපෘති දෙකකට වෙන් කර ඇත. OCHP ව්‍යාපෘතියේ (අදියර III) ගිණුම්වල ආරම්භයේ සිට රු. මිලියන 1,984ක් OCHP (අදියර I) ව්‍යාපෘතියට වගකීමක් ලෙස දැක්වා තිබුණි. | වාර්තා කරන දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සහ වගකීම්වල නිවැරදි වටිනාකම දැක්වීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

2013 ජනවාරි 01 දින අමාත්‍ය මණ්ඩලය විසින් පිරිනමන ලද අනුමැතිය යටතේ අනාරාධිත ලංසු කැඳවීම් පදනම මත තෝරාගත් විදේශ සමාගමකට රු. මිලියන 66,696 ක පිරිවැයකට 2013 පෙබරවාරි 21 දින මහාමාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2014 අගෝස්තු මස කොන්ත්‍රාත්කරු කාර්යයේ යෙදී තිබුණද රජයන්වල වෙනස්වීම් සහ විෂය පථයේ පසුව සිදුකරන ලද වෙනස්කම් හේතුවෙන් අදාල ඉදිකිරීම් කටයුතු මාස 16 ප්‍රමාදයකින් පසු 2016 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය එහි ඉදිකිරීම් කටයුතු 2019 ජුනි 13 වන දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණද කොන්ත්‍රාත්කරු විසින් සිදුකරන කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතියේ අවසන් දිනය 2019 දෙසැම්බර් 10 දක්වා දින 180 කින් දීර්ඝකර තිබුණි. අපේක්ෂිත ප්‍රගතිය සියයට 100 ට එරෙහිව 2019 දෙසැම්බර් 31 දිනට මහාමාර්ග ඉදිකිරීමේ කටයුතුවල සමස්ථ ප්‍රගතිය සියයට 96.13 ක්ව පැවතුණි. කෙසේවෙතත්, මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් වීමට පෙර ණය ගිවිසුම් කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කිරීමට නොහැකිවී තිබුණි. එහි

ප්‍රතිඵලයක් ලෙස අරමුදල් නොමැතිවීම හේතුවෙන් රු මිලියන 1,417 ක් වටිනා වඩා අත්‍යාවශ්‍ය කටයුතු නිමකිරීමට නොහැකිවී තිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------- | ------------- | ------------------- | -------------- |
| (අ) | ණය ගිවිසුමේ බලපැවැත්වෙන දිනට 2014 දෙසැම්බර් 03 දිනය වුවද විෂය පථය වෙනස්වීම් සහ දේශීය අරමුදල්වලින් සියයට 5ක අත්තිකාරම කොන්ත්‍රාත්කරුට ගෙවීමේ ප්‍රමාදවීම හේතුවෙන් වියපැහැදම් වීම ආරම්භ වීම 2015 දෙසැම්බර් 30 දක්වා ප්‍රමාදවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය විසින් රු. මිලියන 91.63ක මුදලක් බැදීම් ගාස්තු ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යාමට ඉඩ ඇත. | මාහාමාර්ග අමාත්‍යවරයා 2015දී මෙම ව්‍යාපෘතිය සමාලෝචනය කිරීම සඳහා කමිටු 2ක් පත්කර තිබුණි. එක් කමිටුවක් වැඩ විෂය පථය අඩු කිරීමට උපදෙස් ලබා දී තිබුණු අතර පසුව මාර්ග සංවර්ධන අධිකාරිය සහ කොන්ත්‍රාත්කරු අතර සංශෝධිත වැඩ විෂය පථය සඳහා 2015.12.23 දින අතිරේක ගිවිසුමක් අත්සන් කරන ලදී. ඊට අමතරව කොන්ත්‍රාත් මුදලින් සියයට 5ක් දේශීය කොටස ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවිය. | ආරම්භයේදී ව්‍යාපෘතියේ වැඩ විෂය නිවැරදිව හඳුනාගත යුතු අතර ව්‍යාපෘතියේ අනවශ්‍ය පිරිවැය අඩුකර ගැනීමට නිසි සැලැස්මක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් ගිවිසුමේ II වන වෙළුමේ සඳහන් දේශීය බදු තත්ත්වයක් පිළිබද 73.2 උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු ඔහුගේ ලාභය මත සේවාදායකයාගේ රටේදී ඔහු ගෙවිය යුතු ව්‍යාපාරික සහ පුද්ගලික බදු ප්‍රතිපූර්ණයට හෝ නිදහස් කිරීමට සුදුසුකම් නොලබයි. කෙසේවෙතත්, ගිවිසුමේ සඳහන් ඉහත කොන්දේසිවලට සහ වෙළුම II පසුව එන නීති උප වගන්තිය 70.5, කොන්ත්‍රාත් ගිවිසුමේ භාවිතයන් පිළිබද කොන්දේසි වලට එරෙහිව ආදායම් බදු අනුපාත ඉහල යාම හේතුවෙන් ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුගේ හිමිකම් | ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යාමට ඉඩ ඇත. | උප වගන්ති 70.5ට අනුකූලව, වෙළුම II පසුව සඳහන් නීති දැක්වේ. භාවිතය පිළිබඳව කොන්දේසි අනුව නීතිය වෙනස්වීම හේතුවෙන් බදු ගෙවීම පිළිබඳව දරණ අමතර පිරිවැය සඳහා පමණක් කොන්ත්‍රාත්කරු සුදුසුකම් ලබන අතර එය ප්‍රතිපූර්ණය කර තිබුණි. | ආදායම් බදු පහත සහ කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි සමග අනුකූල වීමට පියවර ගත යුතුය. |

ඉල්ලීමක් ලෙස ආදායම් බදු රු.මිලියන 359.46 ක් ප්‍රතිපූර්ණය කිරීමට පියවර ගෙන තිබුණි.

## 3.3 ඌන උපයෝජිත සම්පත්

| | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ----------- | ----------- | -------------------------- | ------------ |
| (අ) | විෂය පථය වෙනස්වීම්, කොන්ත්‍රාත්කරු විසින් සිදුකරන ලද වැඩවල මන්දගාමී ප්‍රගතිය හා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන් මුළු ණය වෙන්කිරීමෙන්, ණය අවසන් දිනය වන 2019 දෙසැම්බර් 03 දින වන විටත් ව්‍යාපෘතිය විසින් මුළු ණය මුදලෙන් සියයට 23.38 ක් නියෝජනය වන එකතුව රු.මිලියන 20,926 කට සමාන එ.ජ.ඩො මිලියන 115.49 ක් උපයෝජනය කර නොතිබුණි. | ව්‍යාපෘතියේ මුළු වැඩ විෂය පථය නිම කිරීමට නොහැකි වේ. | 2014.12.30 දින සිට ණය ගිවිසුම බලාත්මක වුවද, සිවිල් වැඩ 2016.01.01 දින සිට ආරම්භ කර තිබුණි. | ණය පහසුකම් ඉක්මවීමට පෙර මුළු ණය මුදල උපයෝජනයට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කල යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ විදේශ ණය සඳහා අයවැය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ 2018 ජූනි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා වන අන්තර් ගෙවීම් සහතික අංක 20,21,22 සහ 24 නිරවුල් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුට පොලී ගෙවීම් නිරවුල් කිරීම 2019 වර්ෂයේදී එකතුව රුපියල් මිලියන 40.58ක් වෙන් කර තිබුණි. | ප්‍රමාද ගෙවීම් මත පොලිය ඉහලයාම | වෙන්කිරීම් හෙවත් අයවැය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ගෙවීම් සඳහා ණය නියෝජිත ආයතනය වෙත IPC ඉදිරිපත් නොකිරීම නිසා එම IPC ප්‍රමාද විය. | ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුගේ බිල්පත් නියමිත කාලයට නිරවුල් කිරීමට ප්‍රතිපාදන සැලසුම් කර ගත යුතුය. |

## 3.4 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබද ගැටළු

| | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ලැබී තිබුණු තොරතුරු අනුව මාර්ග ඉදිකිරීමේ අරමුණු සඳහා ව්‍යාපෘතිය මගින් වත්තල සහ මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාල යටතේ පවතින රජයේ ඉඩම් කොටස් 234 ක් ඇතුළුව ඉඩම් කොටස් 1,706 ක් අත්පත් කරගෙන තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා රු. මිලියන 6,431.07 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. තවද, වන්දි මුදල් නිරාකරණය කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය මගින් රු. මිලියන 968.22 ක පොලී මුදලක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.<br>කෙසේවෙතත්, ඉඩම් කොටස් 415 ක පමණක් අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. | ප්‍රමාද වු වන්දි මත පොළී පිරිවැය ඉහල යාම | ව්‍යාපෘතියේ මුදල් නොමැතිවීම හේතුවෙන් බලපාන ලද පාර්ශවයන් වෙත වගන්ති 17 යටතේ ගෙවීම් ප්‍රමාද සඳහා පොළී ගෙවීමට සිදුවේ. වගන්ති 44 ප්‍රසිද්ධ කිරීමේ ප්‍රමාදයන් පවතින අතර මේ දක්වා ඉඩම් කොටස් 415අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. | වන්දි මුදල් නිරවුල් කිරීම ප්‍රතිපාදන සහ අවශ්‍ය මුදල් සැලසුම් කර ගත යුතු අතර ඉඩම් අත්පත් කර ගැනීමේ සැලසුමට අනුව ඉඩම් අත්පත් කර ගත යුතුය. |
| (ආ) | නැවත පදිංචි කිරීමේ අරමුණින් ව්‍යාපෘතිය විසින් 2014 වර්ෂදී රු. මිලියන 96.19 ක පිරිවැයකට හෙක්ටෙයාර් 2.43 කින් යුත් ජයසුමනවත්ත ඉඩම මිලදී ගෙන තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව, පවුල් 36 කින් වාරික පදනමින් ඉඩම් කොටස්වල පිරිවැය අයකර ගැනීමට ව්‍යාපෘතිය පියවර ගෙන තිබුණි. කෙසේවෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් පවුල් 08 කින් එකතුව රු. මිලියන 18.84 ක් පමණක් අයකරගෙන තිබුණි. | මුළු ඉඩම් පිරිවැයෙන්, පවුල් 27කින් එකතුව රු.මිලියන 77.35ක් අයකර ගත නොහැකි වේ. | ජයසුමනවත්ත ඉඩම් කොටස් 36ක් පවතින අතර ඉඩම් කොටස් සඳහා මේ දක්වා පුද්ගලයින් 09 දෙනෙකු පමණක් ගෙවීම් සිදු කර ඇත. කඩවත අන්තර් හුවමාරුව සඳහා අමතර අත්පත් කර ගැනීම හේතුවෙන් අවතැන්වූ පුද්ගලයන් සඳහා ඉතිරි ඉඩම් කොටස් නැවත බෙදා වෙන් කර ඇත. ව්‍යාපෘතිය ඔවුන් සඳහා සම්පූර්නයෙන්ම වන්දි මුදල් ගෙවා නොමැති නිසා ඔවුන් ඉඩම් කොටස් වලට ගෙවීම් සඳහා යම් කාලසීමාවක් ඉල්ලා ඇත. | ව්‍යාපෘතිය අවසන් වීමට පෙර ඉතිරි ඉඩම් කොටස් බෙදා වෙන් කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතිය පැලියගොඩ පුත්තලම මාර්ගයෙ අසල A3 අන්තර් හුවමාරුවක් ඉදිකිරීම සඳහා මත්තුමාගල පිහිටි හෙක්ටෙයාර 27.02ක ඉඩමක් අත්පත් කර ගැනීමට රු.මිලියන 22.31ක් වැයකර තිබුණද, ව්‍යාපෘතිය පසුව මත්තුමාගල A3 අන්තර් හුවමාරුව අවලංගු කර තිබුණු අතර කඩවත නව අන්තර් හුවමාරුව හඳුන්වා දී තිබුණි. එහි ප්‍රතිඵලක් ලෙස A3 අන්තර් හුවමාරුව සඳහා මත්තුමාගල පිහිටි ඉඩම අත්පත් කර ගැනීමට දරණ ලද රු.මිලියන 22.31 නිෂ්ඵල වියදමක් විය. | දරණ ලද පිරිවැය නිෂ්ඵල වීම. | මුල් සැලැස්මේ මහා මාර්ගයෙන් A3 මාර්ගයට ඇතුළුවීමේ හා පිටවීමේ අන්තර් හුවමාරුවක් පැවතුණි. A3 මාර්ගයෙන් මීටර් 900ක් එහා කෙරවලපිටිය අන්තර් හුවමාරුව පවතින නිසා A3 මාර්ගයට ඇතුළුවීමේ හා පිටවීමේ අන්තර් හුවමාරුවක් දමන්නේ නම් සමහර සැලසුම් අවශ්‍යතාවයන් පූර්ණ නොවන බව පසුව හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, මෙහෙයුම්හා නඩත්තු අවශ්‍යතාවයන් සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඔවුන්ට ඉඩමක් අවශ්‍ය බව EOMPM අංශයේ අදහස වන අතර අනාගතයේදී එම අරමුණ සඳහා මෙම ඉඩම යොදා ගනු ලැබේ. | පාඩු අවම කර ගැනීමට පියවර ගත යුතුය. |